# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2422/42 – 2025 පෙබරවාරි මස 06 වැනි බ්‍රහස්පතින්දා – 2025.02.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

39 (අ) (1) වැනි වගන්තිය යටතේ නියමය

2013 ඔක්තෝබර් මස 04 වැනි දින අංක 1830/51 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* (460 වැනි අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පළ කරන ලද 2013 අංක 300 දරන ආඥාවේ සඳහන් ඉඩම් කොටස් රජය වෙත සම්පූර්ණයෙන්ම සතු වී ඇති අතර රජය සඳහා සහ ඒ වෙනුවෙන් එකී පනතේ 40 වැනි වගන්තියෙහි (අ) ඡේදය යටතේ එම ඉඩම් කොටසේ සන්තකය ද ලබාගෙන තිබේ. එහෙත් එම පනතේ (1979 අංක 8 දරන පනතින් ඇතුළත් කරන ලද 39 අ (1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම එකී ඉඩම් කොටස් අතුරින් මෙහි පහත 1 උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස් පමණක් මෙම නියමය මගින් අවසතු කරමි.

**කේ.ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්,
ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය : 4-3/10/2012/LRB/234.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරිගේ අංකය : WGSWD&EIP/ACQ/MH/07.

2025 ජනවාරි මස 08 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

### 1 වන උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 526D, ජම්බුගස්මුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, ගංගොඩවිල (කොට්ඨාස අංක 22 - ගංගොඩවිල, මහරගම නගර සභා සීමාව තුළ) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/DSO/2023/325 හා 2024.02.28 දිනැති පැහැදිලි කිරීමේ අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණයන්ගෙන් යුක්ත වූ ඉඩම් කොටස්වලට මායිම් :

01. **කැබලි අක්ෂර 'C' - ගුණවර්ධන උයන්වත්ත වරිපනම් අංකය සොයාගත නොහැක උද්‍යාන මාවත - ප්‍රමාණය : හෙක්. 0.0318**

උතුරට: කැබලි අක්ෂර D, මූ.පි.කො. 9628 හි කැබලි අංක 28, මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A සහ B; නැගෙනහිරට: කැබලි අක්ෂර B, හැරිස් සිල්වා වත්තුහේවා හිමිකම් කියන උද්‍යාන මාවතේ වරිපනම් අංක 7 දරන ඉඩම සහ ඒ.එස්.කේ. මැණිකේ සහ එච්.එස්. ඩයස් හිමිකම් කියන උද්‍යාන මාවතේ වරිපනම් අංකය නොදන්නා ඉඩම; දකුණට: කැබලි අක්ෂර G සහ J; බටහිරට: කැබලි අක්ෂර J, K, D, මූ.පි.කො. 9628 හි කැබලි අක්ෂර සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර A.


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. **කැබලි අක්ෂර 'G' - ප්‍රමාණය : හෙක්. 0.0108**

උතුරට: කැබලි අක්ෂර C, හැරිස් සිල්වා වත්තුහේවා හිමිකම් කියන උද්‍යාන මාවතේ වරිපනම් අංක 7 දරන ඉඩම, ඒ.එස්. කේ. මැණිකේ සහ එච්.එස්. ඩයස් හිමිකම් කියන උද්‍යාන මාවතේ වරිපනම් අංකය නොදන්නා ඉඩම සහ කැබලි අක්ෂර E; නැගෙනහිරට: කැබලි අක්ෂර E, මූ.පි.කො. 9628 හි කැබලි අංක 10 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර F; දකුණට: මූ.පි.කො. 9628 හි කැබලි අංක 10 සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර F, N, M, H, K සහ J; බටහිරට: කැබලි අක්ෂර H, K සහ J.

03. **කැබලි අක්ෂර 'J' - ගුණවර්ධන උයන්වත්ත වරිපනම් අංකය සොයාගත නොහැක උද්‍යාන මාවත - ප්‍රමාණය : හෙක්. 0.0054**

උතුරට: කැබලි අක්ෂර D, C සහ G; නැගෙනහිරට: කැබලි අක්ෂර G සහ H; දකුණට සහ බටහිරට: කැබලි අක්ෂර K.

04. **කැබලි අක්ෂර 'M' - ගුණවර්ධන උයන්වත්ත වරිපනම් අංකය සොයාගත නොහැක උද්‍යාන මාවත - ප්‍රමාණය : හෙක්. 0.0003**

උතුරට: කැබලි අක්ෂර G; නැගෙනහිරට: කැබලි අක්ෂර G, F සහ N; දකුණ: කැබලි අක්ෂර N සහ H; බටහිරට: කැබලි අක්ෂර N, H සහ G.

EOG 02-0062

---

## ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

### 39 (1) වැනි වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ පනවන ලද්දාවූ ද, අංක 1861/6 හා 2014.05.05 වැනි දින දරන රජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද්දාවූ ද, 2014 අංක 95 හා 2014.04.28 වැනි දින දරන ආඥාවේ සවිස්තරව දැක්වෙන ඉඩම් කොටස් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත පැවරී තිබේ. පහත විස්තරවන එම ඉඩම් කොටස්වල භුක්තිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙනුවෙන් මෙතෙක් භාරගෙන නොමැත. එබැවින් කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම ඉඩම් අත්කර ගැනීමේ පනතේ 39 (1) වැනි වගන්තිය යටතේ මා හට පැවරී ඇති බලතල අනුව අංක 1861/6 හා 2014.05.05 වැනි දින දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද ඉහත සඳහන් 2014 අංක 95 හා 2014.04.28 වැනි දින දරන ආඥාවේ පහත උපලේඛනයේ සඳහන් ඉඩම් කොටස පමණක් මෙම නියමය මගින් ප්‍රත්‍යාදිෂ්ඨ කරමි.

**කේ.ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්,
ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය : 4-3/10/2012/LRB/223.
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරීගේ අංකය : WGSWD&EIP/ACQ/MH/08.

2025 ජනවාරි මස 08 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
මිහිකත මැදුර, ඉඩම් මහ ලේකම් කාර්යාලය,
1200/6, රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

#### උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 526D, ජම්බුගස්මුල්ල ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පැපිළියාන (කොට්ඨාස අංක 21, මහරගම නගර සභා සීමාව) ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක CO/DSO/2024/196 හා 2024.07.12 දිනැති අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුක්ත වූ ඉඩම් කොටසට මායිම්:

01. **කැබලි අක්ෂර 'A' - කෝන්ගහවත්ත, මාදන්කුඹුර හෙවත් නින්දේ කුඹුර - ප්‍රමාණය : හෙක්. 0.0601**

උතුරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B, මූ.පි.කො. 9623 හි කැබලි අංක 12 සහ මූ.පි.කො. 9623 හි කැබලි අංක නොකරන ලද ඇළ; නැගෙනහිරට: මූ.පි.කො. 9623 හි කැබලි අංක නොකරන ලද ඇළ සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර E; දකුණට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර E, F සහ D; බටහිරට: මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර D, C, D සහ මූ.පි.කො. 9623 හි කැබලි අංක 12.

EOG 02-0063

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.